# නිවාස ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY

CONSTRUCTION EQUIPMENT
OPERATOR TRAINING COLLEGE

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## නව ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ සැපයීම හා ගෙනවිත් භාරදීම

### ප්‍රසම්පාදන අංකය: 1/4/7/00/139-2026

1. මෙම ලංසු කැඳවීම, 2026.10.13 දිනැතිව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ප්‍රකාශිත අංක 1/4/7/00/139-2026 දරන මෙම ව්‍යාපෘතිය සඳහා වන සාමාන්‍ය ප්‍රසම්පාදන නිවේදනයට අනුකූල වේ.

2. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, CIDA ආයතනය සඳහා නවතම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ සැපයීම සහ ගෙනවිත් භාරදීම වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්ට එක් අයිතමයක් හෝ සියලුම අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැක.

| අංකය | යන්ත්‍ර/උපකරණ වර්ගය | එක් එක් යන්ත්‍රයක් සඳහා අවශ්‍ය ලංසු සුරක්ෂණය හෝ මුදල් තැන්පතුව (රු.) | ලංසු සුරක්ෂණයේ වලංගු කාලය | ලංසුවේ වලංගු කාලය |
|---|---|---|---|---|
| 01 | ෆෝක්ලිෆ්ට් ට්‍රක් රථය (Forklift Truck) | 100,000.00 | 22.02.2027 | 25.01.2027 |
| 02 | ට්‍රක් රථයක සවිකළ දෙඹකරය (Truck mounted Crane) | 230,000.00 | | |

3. ගෙනවිත් භාරදීමේ කාලය උපරිම දින 60ක් වන අතර, ගෙනවිත් භාරදියයුතු ස්ථානය වන්නේ ගල්කුලම පිහිටි ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විද්‍යාලයයි (OTC).

4. ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාපටිපාටිය හරහා මෙම ලංසු කැඳවීම සිදු කෙරේ.

5. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) අධ්‍යක්ෂිකා/ඉ.යා.සේ. ඉංජිනේරු ජේ.ඒ.එන්.එන්.කේ. ජයකොඩි මහත්මියගෙන් **jnimanthi@gmail.com** හරහා ලබාගත හැකි අතර, **2026.10.13 සිට 2026.10.23 දක්වා** සාමාන්‍ය **වැඩකරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා** සැපයුම් අංශයෙන් ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැක.

6. පූර්ව ලංසු රැස්වීම **2026.10.21 දින පෙරවරු 10.30** ට CIDA සම්මන්ත්‍රණ ශාලාවේදී (**123, සව්සිරිපාය, විජේරාම මාවත, කොළඹ 07**) පැවැත්වේ.

7. සුදුසුකම් අවශ්‍යතා පහත දක්වා ඇත:

   * මෙම ලංසු ලේඛනය යටතේ ඉදිරිපත් කර ඇති මාදිලියේ සහ වර්ගයේම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ රජයේ/අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවලට සැපයීම සම්බන්ධයෙන් අවම වශයෙන් අඛණ්ඩව වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.
   * පසුගිය වසර පහක කාලය තුළ එම මාදිලියේ සහ වර්ගයේම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අවම වශයෙන් සිව් (4) වතාවක් රජයේ ආයතන වෙත සපයා තිබීමේ පළපුරුද්ද.
   * ලංසුකරු විසින් ශ්‍රී ලංකාව තුළ අදාළ වෙළඳ නාමය සඳහා ලංසු තැබීමට නිෂ්පාදකයාගේ තොරතුරු සහ නිෂ්පාදකයාගේ බලය පැවරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.
   * අවම වශයෙන් පසුගිය වසර 5ක කාලය තුළ ලංසුකරු විසින් අදාළ නිෂ්පාදකයාගේ දේශීය නියෝජිතයෙකු ලෙස කටයුතු කර තිබීම.
   * යන්ත්‍රෝපකරණ සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදකයා ISO 9001:2008 තත්ත්ව සහතිකකරණය ලබා තිබිය යුතු අතර, එහි වලංගු පිටපතක් ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

**අතිරේක තොරතුරු ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත.**

8. ආපසු නොගෙවන **රුපියල් 8,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් සහ පහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් යුත් ප්‍රසම්පාදන ලේඛන සම්පූර්ණ කට්ටලයක්, මිලදී ගත හැක. ගෙවීම් ක්‍රමය වන්නේ CIDA හි සරප් වෙත මුදලින් ගෙවීමයි.

9. ලංසු පහත ලිපිනයට **2026.10.26 දින පස්වරු 2.30** ට හෝ ඊට පෙර ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. **2026.10.26 දින පස්වරු 2.30** ට පහත ලිපිනයේදී සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ලංසු මුල් පිටපත සහ අනු පිටපත වෙන වෙනම කවර දෙකක බහා මුද්‍රා තබා නැවත එම කවර දෙකම තනි එක් පිටත කවරයක බහා මුද්‍රා තබා එහි ඉහළ වම් කෙළවරේ "**CIDA සඳහා නවතම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ උපකරණ සැපයීම සහ ගෙනවිත් භාරදීම** " ලෙස සඳහන් කළ යුතුය.

10. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක් හෝ මුදල් තැන්පතුවක් අමුණා තිබිය යුතු අතර, ඉහත වගුවට අනුව ලංසු සුරක්ෂණය වලංගු විය යුතුය.

11. ඉහත වගන්තිවල සඳහන් කර ඇති ලිපිනය/ලිපින වන්නේ :

    **සැපයුම් අංශය,**

    **2 වන මහල,**

    **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,**

    **"සව්සිරිපාය", නො. 123, විජේරාම මාවත,**

    **කොළඹ 07.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,**
**"සව්සිරිපාය", නො. 123,**
**විජේරාම මාවත, කොළඹ 07.**
**2026.10.13**